ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජූලි 2015

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

---

නව විෂය නිර්දේශය හා නව ආකෘතියක් යටතේ ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය ඉදිරිපත් වුව ද බොහෝ අයදුම්කරුවන් එයට සාර්ථකව මුහුණ දී තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් සාධනීය ලකුණු මට්ටමට ළඟා වී නොතිබුණු අතර ඒ සඳහා පොදුවේ බලපා තිබූ හේතු කිහිපයක් පහත පරිදි හඳුනා ගන්නා ලදී:

## A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40** (ලකුණු 02 බැගින් බහුවරණ ප්‍රශ්න 20)
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය සකස් වී තිබුණේ සමස්ථ විෂය නිර්දේශය තාර්කිකව ආවරණය වන ලෙස සහ අයදුම්කරුවන්ට විෂය නිර්දේශය පිළිබඳ ඔවුන්ගේ දැනුම භාවිතයෙන් උපරිම ලකුණු ප්‍රමාණයක් අත්කර ගැනීමට හැකිවන ලෙස ය.

සමස්තයක් ලෙස ගත්කල මෙම ප්‍රශ්නය සඳහා බොහෝ අයදුම්කරුවන්ගේ සාධන මට්ටම පැවතියේ මුළු ලකුණු 40 න් ලකුණු 20 - 30 ත් සීමාව අතර විය. එහිදී බහුතරයකට නිවැරදි පිළිතුරු සැපයීමට නොහැකි වූ ප්‍රශ්න කාණ්ඩ කීපයක් හඳුනා ගන්නා ලදී. ඒ අනුව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ට නිරීක්ෂණය වූ පහත දැක්වෙන අඩුපාඩු දැක්විය හැකිය.

**ප්‍රශ්න අංක 1.8**

2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය නිවැරදිව හඳුනා ගැනීමට අයදුම්කරුවන් අසමත්ව තිබුණේ අතිරේක විෂයානුබද්ධ කියවීම්වල නිරත නොවීම හා ප්‍රායෝගික දැනුම ප්‍රමාණවත් නොවීම නිසා බව නිශ්චය කළ හැකිය.

**ප්‍රශ්න අංක 1.11 සිට 1.15 දක්වා**

සත්‍ය හෝ අසත්‍ය බව හඳුනා ගැනීම සඳහා ලබා දී තිබූ මෙම ප්‍රශ්න 5 ට එතරම් සාර්ථක පිළිතුරු සැපයීමක් දක්නට නොලැබුණි. අවම වශයෙන් ප්‍රශ්න දෙකකට වත් නිවැරදි පිළිතුරු සැපයීමට බොහෝ අයදුම්කරුවන් අසමත් වූ අතර එහිදී ආන්තික උපයෝගිතාව, ආන්තික හා සාමාන්‍ය පිරිවැය ආදී ක්ෂේත්‍රයන්හි සීමිත දැනුමක් පවතින බව හඳුනාගත හැකිවිය.

**ප්‍රශ්න අංක 1.19 සහ 1.20**

පූර්ණ තරඟකාරී වෙළෙඳපොළ ව්‍යුහය හා එයට අදාල ලාභ උපරිම වන පිරිවැය තත්ත්ව පිළිබඳ අයදුම්කරුවන්ගේ අවබෝධය අපේක්ෂිත මට්ටමට ළඟා වී නොමැති බව මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී පෙන්නුම් කර ඇති දුර්වලතාවයන්ගෙන් පැහැදිලි වේ. මෙයට පිළිතුරු සැපයීමට ඉදිරිපත්ව සිටි ප්‍රතිශතය ඉතා පහළ මට්ටමක පැවති අතර ඉන් නිවැරදි පිළිතුරු හඳුනා ගැනීමට සමත්ව සිටියේ ඉතා සුළු පිරිසක් පමණි. ඒ අනුව වෙළෙඳපොළ ව්‍යුහය හා පිරිවැය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතුය.

තවද 1.4, 1.5 සහ 1.9 යන ප්‍රශ්න වලට නිවැරදිව පිළිතුරු සපයා තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි.

# B කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න 4 කින් සමන්විත විය.

## ප්‍රශ්න අංක **02** - ලකුණු 08
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

(a) "මිනිස් අවශ්‍යතාවයන්" සහ "මිනිස් උවමනාවන්" අතර වෙනස ඉතා සාර්ථකව පැහැදිලි කරමින් උපරිම ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට බහුතරයක් සමත් වී තිබුණි. සුළු පිරිසකට පමණක් මුළු ලකුණු ලබා ගැනීමේ අවස්ථාව මගහැරී තිබුණේ වෙනස දැක්වීමේදී නිදසුන් ඉදිරිපත් නොකිරීම හේතුවෙනි.

(b) හිඟකම ආර්ථික විද්‍යාවේ පදනම ලෙස නිගමනය කිරීමට අවශ්‍ය විවිධ පැතිකඩ තර්කානුකූලව පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම මැනීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිතය. හිඟකම යන්න හඳුන්වා අර්ථ නිරූපණය කිරීමට බහුතරයක් සමත් වුව ද පහත දුර්වලතා ද දක්නට ලැබුණි.

- අපේක්ෂිත අයුරින් හිඟකම පිළිබඳ ආර්ථික විද්‍යාත්මක සම්බන්ධය නිවැරදිව නොගැලපීම.
- හිඟකම සාපේක්ෂ අර්ථයෙන් පැහැදිලි නොකිරීම.
- තෝරා ගැනීම, සම්පත්හි විකල්ප භාවිතයක් පැවතීම, ආවස්ථික පිරිවැය ආදී සංකල්පයන්ගේ අන්තර් සම්බන්ධතාව ඔවුන්ගේ පිළිතුරට ඇතුලත් නොකිරීම.

බොහෝ අයදුම්කරුවන්ගේ සමස්ථ ලකුණු ප්‍රමාණයට ඉහළ දායකත්වයක් සැපයීමට මෙ ප්‍රශ්නය සඳහා ලබා ගත් ලකුණු ප්‍රමාණය හේතු වී තිබුණි.

## ප්‍රශ්න අංක **03** - ලකුණු 08
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

(a) ප්‍රස්තාරයක් ආධාරයෙන් පූර්ණ තරඟකාරී ආයතනයක දිගුකාලීන සමතුලිතය පිළිබඳව විමසන මෙම ප්‍රශ්නය හමුවේ අයදුම්කරුවන් අති බහුතරයක් අසාර්ථක වී තිබුණි. පිරිවැය වක්‍ර හා ඒවායේ හැසිරීම සමතුලිතතාවයට බලපාන අයුරු නිසිලෙස ග්‍රහණය කර ගැනීමට වැඩි පිරිසක් අසමත්ව තිබූ බව පහත අඩුපාඩු වලින් සනාථ විය.

- පූර්ණ තරඟකාරී ආයතනයක දිගුකාලීන සමතුලිතය වෙනුවට ඉල්ලුම් සැපයුම් වක්‍ර සහිත වෙළෙඳපොල සමතුලිතය දක්වා තිබීම.
- මෙම ප්‍රශ්නයට කිසි ලෙසකින් හෝ අදාල නොවන ප්‍රස්ථාර නිර්මාණය කර තිබීම.
- ප්‍රස්තාර ඇසුරින් තර්කානුකූල පැහැදිලි කිරීම් දක්වා නොතිබීම.

(b) සාපේක්ෂව බලන කල මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු වැඩි ප්‍රමාණයක් ලැබී තිබුණි. නමුත් ඇතැම් අයදුම්කරුවන් විසින් පූර්ණ තරඟයේ ලක්ෂණ හෝ වෙළෙඳපොල ආර්ථිකයක ලක්ෂණ දක්වා තිබූ පිළිතුරු ද දක්නට ලැබුණි.

සමස්ථයක් ලෙස මෙම ප්‍රශ්නයට සපයා තිබූ පිළිතුරු වලින් කැපී පෙනෙනුයේ වෙළෙඳපොල ව්‍යුහය හා පිරිවැය තත්ත්ව පිළිබඳ අයදුම්කරුවන්ගේ අවබෝධය අපේක්ෂිත මට්ටමට වඩා පහළින් පවතින තත්ත්වයක් දක්නට ඇති බවය.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 08**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

(a) මුදලේ අගය යන්න නිවැරදිව හඳුනා ගැනීමට අසමත් වීම හේතුවෙන් "මුදලේ අගය" වෙනුවට මුදලේ නිර්වචනය, මුදලක ලක්ෂණ, මුදලේ කාර්යයන්, මුදලේ විකාශය, මුදලට ඇති ඉල්ලුම යනාදි අනවශ්‍ය කරුණු පැහැදිලි කර තිබුණි.

නමුත් ඇතැම් අයදුම්කරුවන් මූර්ත හා නිල අගය, දේශීය හා විදේශීය අගය යන සංකල්ප නිවැරදිව හඳුනාගෙන තිබූ අතර ඇතැමුන් සංකල්පය හඳුනා ගත්ත ද "මූර්ත" යන්න සඳහන් කිරීමට අසමත් විය.

(b) මෙම ප්‍රශ්නය සඳහා සාර්ථකව පිළිතුරු සැපයූ අයදුම්කරුවන් පිරිස කෙටි නමුදු පොදු කරුණු දැක්වීම තුළින් මිල මට්ටම ඉහළ යැමේ ඍජු හා වක්‍ර ප්‍රතිඵල දක්වා තිබුණි.

සමස්ථයක් ලෙස මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සැපයීමට අසමත් වූ අයදුම්කරුවන්ගේ පිළිතුරුවල තිබූ දුර්වලතා කිපයක් පහත දැක්වේ:

- අදාල නොවන ප්‍රථිපල දැක්වීම (ආනයන හා අපනයන, විදේශ ණය, ආදිය)
- වැරදි කරුණු දැක්වීම (ජන ජීවිතය උසස් වීම, ආර්ථික වර්ධනය, ආදිය)
- මිල මට්ටම ඉහළ යාමෙන් ආර්ථිකයට යහපත් බලපෑමක් ඇතිවන බව ඉස්මතු කිරීම.
- මිල මට්ටම ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස "උද්ධමනය" දැක්වීම.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 08**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

(a) මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමට ඉදිරිපත්ව සිටියේ අයදුම්කරුවන්ගෙන් ඉතාමත් ස්වල්ප පිරිසකි. "ගෙවුම් ශේෂය" යන්නෙහි අදහස පැහැදිලි කිරීම පිළිබඳ ප්‍රශ්නය හමුවේ අයදුම්කරුවන්ගෙන් අති බහුතරයක් බොහෝ අසාර්ථක වී තිබුණි. බොහෝ පිරිසකට "ගෙවුම් ශේෂය" යන්න පිළිබඳව දළ අවබෝධයක් හෝ නොතිබූ බව සපයා තිබූ පිළිතුරු වලින් තහවුරු විය.

උදා: ගෙවීමක් කළ පසු ඉතිරි වූ ශේෂය, ගෙවීමට ඇති ඉතිරි ශේෂය යනුවෙන් දක්වා තිබුණි.

(b) ඉහත ක්ෂේත්‍රය පිළිබඳව ඇති නොදැනුවත්භාවය නැවතත් තහවුරු කරමින් මෙම කොටස සඳහා පිළිතුරු සැපයීම ද අසාර්ථක හා අවම මට්ටමක විය. සපයා තිබූ පිළිතුරු අතර ද බහුල වූයේ ආර්ථික ප්‍රතිපත්ති, මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති, අපනයන හා ආනයන වෙළෙඳාම යනාදි වක්‍රාකාරයෙන් සම්බන්ධිත පොදු කරුණුය.

සමස්ථයක් ලෙස "ගෙවුම් ශේෂය" ආශ්‍රිත විෂය කරුණු පිළිබඳ අයදුම්කරුවන්ගෙන් බහුතරයට දළ අවබෝධයක් හෝ නොපවතින බැවින් ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු බව දැක්විය හැකිය.

## <u>C කොටස</u>

**ප්‍රශ්න අංක 06 - ලකුණු 15**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

(a) අයදුම්කරුවන් බොහොමයක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. ඇතැම් පිරිස් රූප සටහන නිවැරදිව නිර්මාණය කර තිබුණ ද එය සාර්ථකව පැහැදිලි කිරීමට අසමත් විය. එමෙන්ම ආර්ථිකයේ අංශ 2 නිවැරදිව හඳුනා නොගැනීම සහ අංශ 3 ක් හෝ 4 ක් ඇතුළත් කිරීම ආදි දුර්වලතා කිපයක් දක්නට ලැබුණි.

(b) දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ සංකල්පයන් පිළිබඳව අයදුම්කරුවන්ගෙන් වැඩි පිරිසකට නිශ්චිත අවබෝධයක් නොමැති බව පිළිතුරු මගින් පෙනී යයි. බොහෝ විට "පවත්නා මිල" හා "ස්ථාවර මිල" යන්න ඒවායේ වචනාර්ථයෙන් පමණක් විග්‍රහ කර තිබූ අතර නිවැරදි නිර්වචනයක් හෝ පැහැදිලි කිරීම් අවම මට්ටමක පැවතුනි.

උදා: ඇතැම් අයදුම්කරුවන් විසින් "ස්ථාවර මිල" යන්න "වෙනස් නොවන මිල" ලෙස ද දක්වා තිබුණි.

(c) අයදුම්කරුවන් සාමාන්‍ය මට්ටමකින් සාර්ථක ගණනය කිරීම් දක්වා තිබුණි. එහෙත් ඇතැම් අයදුම්කරුවන්ට සාධක පිරිවැය මිල හා වෙළෙඳපොළ මිල අතර සම්බන්ධතාවය නිවැරදිව හඳුනා ගැනීමට අපහසු විය.

එවැනි අවස්ථාවන්හි පහත අඩුපාඩු දක්නට විය:

- වක්‍ර බදු හා සහනාධාර නිවැරදිව නොගැලපීම.
- විදේශ ශුද්ධ සාධක ආදායම ගැලපිය යුතු ස්ථානය නිවැරදිව හඳුනා නොගැනීම.
- අවසන් අගය ලබා ගත් අයුරු පෙරවැඩ තුළින් නොදැක්වීම.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) ආර්ථික වර්ධනය හා සංවර්ධනය අතර වෙනස නිවැරදි නිර්වචන සමග පැහැදිලි කිරීමට අවශ්‍ය මූලික සංකල්පනාත්මක අවබෝධයෙන් තොරව බොහෝ අයදුම්කරුවන් විසින් තම දැනුම් මට්ටමට අනුව නිදහස් පිළිතුරු සපයා තිබුණි.

පිළිතුරුවල අසාර්ථකභාවයට හේතු වූයේ සංවර්ධනය යනු යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමක් හෝ ආර්ථිකය තවදුරටත් වර්ධනය වීමක් ලෙස හඳුනාගෙන තිබීමය. එමෙන්ම වර්ධනය යනු කෙටි කාලීන දියුණුවක් හා සංවර්ධනය යනු දිගුකාලීන දියුණුවක් ලෙස දක්වා තිබීම ද, නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර මගින් පැහැදිලි කිරීමට උත්සාහා කිරීම ද දක්නට විය.

(b) ආර්ථික වර්ධනය ළඟාකර ගැනීමට අවශ්‍ය සාධක දැක්වීමේදී අයදුම්කරුවන් තරමක් දුරට සාර්ථක වී ඇත. ඇතැම් අයදුම්කරුවන් නිවැරදි කරුණු දක්වා ඉහළ ලකුණු ලබා ගැනීමට සමත් වුව ද තවත් අය ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගැනීම නිසා අදාල නොවන කරුණු ලියා තිබීම දක්නට හැකි විය.

උදා: දළ දේශීය නිෂ්පාදිතය, ඒක පුද්ගල ආදායම, නිෂ්පාදන සාධක, ආර්ථික යටිතල පහසුකම් ආදිය දක්වා තිබුණි.

(c) සාපේක්ෂව ගත් කල මෙම ප්‍රශ්නය අයදුම්කරුවන් සාර්ථකව මුහුණ දුන් ප්‍රශ්නයකි. ආර්ථික සහ සමාජ සුභසාධනය වැඩි දියුණු කිරීම සඳහා රජය වෙළෙඳපොළට මැදිහත් වන ආකාරයන් විග්‍රහ කිරීමට අයදුම්කරුවන් විසින් වර්තමාන ශ්‍රී ලංකාවේ ප්‍රායෝගික රාජ්‍ය මැදිහත් වීම් පිළිබඳ අවබෝධය ද උපයෝගී කොට ගෙන ඇතැයි සිතිය හැක. වැඩි පිරිසක් මෙම ප්‍රශ්නය සඳහා සතුටුදායක අයුරින් ලකුණු ලබාගෙන තිබුණි.

සමස්ථයක් වශයෙන් බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට තමාගේ අර්ථකතනයන්ට අනුව නිදහස් පිළිතුරු සපයා තිබුණ.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති පිළිතුර පිළිබඳව නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

4. ප්‍රස්තාර හරියාකාරව නම් කිරීම හා පැහැදිලි කිරීම.

5. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

9. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -